ශ්‍රී ලංකා දුම්රිය සේවය

இலங்கை புகையிரத சேவை

**SRI LANKA RAILWAYS**

# දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සේවා ගණය

## දුම්රිය රියදුරු කාර්යභාර නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

**MN - 07 - 2016**

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපත්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

### 01. සම්බන්ධවන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
යොමු අංකය : ප.06/178/2016 දිනය : 2018.07.10

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/03/12 දිනය : 2018.07.20

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/1142 දිනය : 2014.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/02/REC/7513 දිනය :2017.11.01

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/02/43/SR-11 දිනය : 2017.07.19

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PST/EST/04-01-43/05/2018 දිනය : 2018.11.15
සංශෝධන 01: 2020.09.15

### 02. පත්කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### 03. සේවා ගණය පිළිබඳ විස්තර:

3.1 සේවා ගණය: කළමනාකරණ සහකාර - අධිපත්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:

අනුමත තනතුර සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/ උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධාරී ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය:** ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ( විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

## 05. වැටුප්:

5.1 වැටුප් කේත අංකය: MN-07 – 2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු 41,580 – 11 x 755 – 18 x 1,030 – 68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 07 | රු.46,110/- |

2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු:

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| දුම්රිය රියදුරු කාර්යභාර නිලධාරි | 09 | • දුම්රිය එන්ජින් කාර්ය මණ්ඩලයට අයත් දුම්රිය එන්ජින් රියදුරු, ෂන්ටින් එන්ජින් රියදුරු, රියදුරු සහායක යන අය අදාළ සේවා වාර සඳහා නිල කිරීම.<br>• දෛනික වැඩ වාර්තා සැකසීම හා ගෙවීම් නිර්දේශ කිරීම.<br>• දුම්රිය නීති උපදෙස් සංග්‍රහයට අනුකූල වන ලෙස හා අවම මූල්‍ය පිරිවැයක් සැකසෙන පරිදි දුම්රිය එන්ජින් කාර්ය මණ්ඩලය නිල කිරීම.<br>• දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) ගේ උපදෙස් ලබාගෙන සුදුසු දුම්රිය රියදුරන් පමණක් අදාළ සේවා වාර වල යෙදවීම.<br>• සේවා වාර අවලංගු වීම වැළැක්වීම සඳහා අමතර නිල කිරීම් නියෝග ලබාදීම.<br>• ප්‍රධාන කාර්යාලයන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, එන්ජින් කාර්ය මණ්ඩලයට අයත් සියළුම රාජකාරි හා එන්ජින් කාර්ය මණ්ඩලයට අයත් පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලය අධීක්ෂණය, තමන් යටතේ පවතින වට්ටෝරුගත භාණ්ඩවල වගකීම දැරීම හා ඒවා නිසි |

| | | |
|---|---|---|
| | | පරිදි නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම.<br>• සේවා වාර අතර නිසි විවේකය ලබා දෙමින් දුම්රිය එන්ජින් කාර්ය මණ්ඩලය නිල කිරීම.<br>• යැපීම් දීමනා - බටා වවුචර් ඉදිරිපත් කිරීම හා ඒවා දී ඇති උපදෙස් පරිදි කාර්ය මණ්ඩලයට නිකුත් කිරීම.<br>• දුම්රිය ප්‍රමාද වීම් හා ක්‍රියාවිරහිත වීම් සම්බන්ධයෙන් රියදුරු වාර්තාව (LF – 75) හා ප්‍රමාදවීම් වාර්තා අදාළ රියදුරන්ගෙන් ලබාගෙන දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික) හරහා අංශ භාර ඉංජිනේරු වෙත ඉදිරිපත් කිරීම.<br>• තොරතුරු සටහන් කිරීමේ පොත, රියදුරු කාර්ය මණ්ඩලයේ පැමිණීමේ ලේඛණය, නිසි පරිදි නඩත්තු කිරීම හා විධිමත්ව පවත්වා ගැනීම.<br>• දෙසති නිවේදන, දුම්රිය කාල සටහන්, විශේෂ දුම්රිය නිවේදන ආදිය දුම්රිය රියදුරන්ට නිකුත් කිරීම හා දැනුම් දීම. දුම්රිය එන්ජින් රියදුරු කාර්ය මණ්ඩලයට දුම්රිය ධාවනයට අදාළ සියළුම නිවේදන නිකුත් කිරීම හා දැනුම් දීම.<br>• දුම්රිය රියදුරන් හා දුම්රිය ධාවන කාර්ය මණ්ඩලය පැමිණීමේ ලේඛණය අත්සන් තැබීමෙන් අනතුරුව ඔවුන් අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන බවට සැහීමකට පත්වීමෙන් පසුව අදාළ සේවා වාරයන්ගේ සේවයට අවස්ථාව ලබා දීම.<br>• හදිසි අවස්ථාවලදී දුම්රිය අවලංගුවීම් වැලැක්වීම සඳහා එම ධාවනාගාරයට අදාළ එන්ජින් ධාවනය කිරීමේ පුහුණුව හා මාර්ග පුහුණුව ලබා තිබීම හා එය ප්‍රායෝගිකව ඉටු කිරීමේ හැකියාව.<br>• පුහුණුව සඳහා යොදවනු ලබන කාර්ය මණ්ඩලයට නිසි පරිදි මාර්ග පුහුණුව ලබා දීමට අදාළ කාර්ය මණ්ඩලය වෙත යොමු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : දුම්රිය රියදුරු කාර්යභාර නිලධාරී: 09

## 07. බඳවා ගැනීමේ ක්‍රමය:

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ. |
| සීමිත | අදාළ නොවේ. |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම: අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම: අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය: විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද :

- දුම්රිය එන්ජින් රියදුරු විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
- අවම වසර 20 ක දුම්රිය ධාවනය පිළිබඳ පළපුරුද්දක් තිබීම.
- සෑම දුම්රිය එන්ජිමක්ම ධාවනය කර තිබීම.
- නාවලපිටිය ධාවනාගාරයට අනුයුක්තව අවම වශයෙන් වසර 02ක කාලයක් දුම්රිය ධාවනය කර පළපුරුද්ද ලබා තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. සියළුම අයදුම්කරුවන් අයදුම් කරන දිනට සේවයේ යෙදී සිටින උප දෙපාර්තමේන්තු ප්‍රධාන මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

IV. අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර ඇති සියළුම අයදුම්කරුවන් අදාළ සුදුසුකම් සපුරා ඇත්දැයි සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් තොරව ලිඛිත තරඟ විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව හිමිවේ. විභාගය සමත් වුවද තරඟ විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව පසුව හෙළි වුවහොත් පත් කිරීම සඳහා සලකා බලනු නොලැබේ. පත්වීම ලබා දීමෙන් පසුව ඒ බව හෙළි වුවහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2 සිට 7.4.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : රියදුරු කාර්යභාර නිලධාරී තනතුර සඳහා තරඟ විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් කුසලතා අනුපිළිවෙලට බඳවාගනු ලබන අතර, එම අවස්ථාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. (පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොවේ.)

සටහන : සුදුසුකම් සම්පූර්ණ කර ඇති එන්ජින් රියදුරු විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් පවතින පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි වන පුරප්පාඩු සඳහා පමණක් දුම්රිය එන්ජින් රියදුරු I ශ්‍රේණියේ වසර 15ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරීන්ගෙන් බඳවා ගනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය :

I. **රියදුරු කාර්ය භාර නිලධාරී තනතුර සඳහා ලිඛිත තරඟ විභාගය**

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50% |
| කළමනාකරණය | පැය 02 | 100 | 50% |

(ඇමුණුම 01)

7.4.4.1.1 පවත්වන බලධාරියා: දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නම් කරනු ලබන රජයේ පිළිගත් ආයතනයක් මගින්

7.4.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.4.4.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | 50 | අදාළ නොවේ. |
| කුසලතාවය | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

2. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ

සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ඇත.

7.4.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: " රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ."

08. **කාර්යක්ෂමතා කඩඉම්:** අදාළ නොවේ.

09. **රාජ්‍ය භාෂා ප්‍රවීණතාව:** අදාළ නොවේ.

10. **ශ්‍රේණි උසස් කිරීම්:** අදාළ නොවේ.

11. **තනතුරුවලට පත් කිරීම:** අදාළ නොවේ.

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ පොදු කොන්දේසි :** අදාළ නොවේ.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:**

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ. "

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:** අදාළ නොවේ.

15. **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.**

16. **මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

17. අන්තර්කාලීන විධිවිධාන: අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ..............................
ඒ. ජේ. පී. අයිශානි
ළමාගාර නිලධාරී (පන්තිය 1)
නම : ..............................
තනතුර: ..............................
දිනය : 2022.11.15

පරීක්ෂා කළේ : අත්සන : ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ..............................
තනතුර: ..............................
දිනය : ..............................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..............................
තනතුර : ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
දුම්රිය සාමාන්‍යාධිකාරී
නිලමුද්‍රාව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය : 2022.11.21

---

යොමු අංකය : MT/03/03/12

2018.11.15 ~~සහ 2020.09.15~~ දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ හි අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික අධිපත්තිය සඳහා වන මෙම බඳවා ගැනීම් පටිපාටිය සහතික කිරීම නිර්දේශ කරමි.

අත්සන: ..............................
නම: ..............................
ලේකම්
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

දිනය: 2022.12.13

නිලමුද්‍රාව : ..............................
ආර්. ඩබ්. ආර්. පේමසිරි
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
07 වන මහල,
සෙත්සිරිපාය, අදියර II
බත්තරමුල්ල

---

යොමුඅංකය : PSC/EST/04-01-43/05/2018

දුම්රිය දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපත්තියට අයත් දුම්රිය රියදුරු කාර්යභාර නිලධාරී තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීම් පටිපාටිය 2018.11.15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................
නම: තනූජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2023.02.22

නිල මුද්‍රාව: තනූජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම 01

01. විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තියට අයත් රියදුරු කාර්යභාර නිලධාරි පටිපාටියට අදාළ ලිඛිත තරඟ විභාගය

02. විභාග පිළිබඳ විස්තර: මෙම විභාගය ලිඛිත තරඟ විභාගයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50% |
| කළමනාකරණය | පැය 02 | 100 | 50% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නම් කරනු ලබන රජයේ පිළිගත් ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන අවස්ථාවන් වලදී

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. සංඛ්‍යාමය ගැටළු, වගු, ගැලපීම් සටහන්, ප්‍රස්ථාර / පින්තූර උපයෝගී කරගනිමින් බහුවරණ ක්‍රමයට මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. මෙය මගින් මාණ්ඩලික නිලධාරියෙකුට තිබිය යුතු දැනුම මට්ටම අපේක්ෂා කෙරෙන අතර, අපේක්ෂකයාගේ තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව මැනිය හැකි වන පරිදි ප්‍රශ්න පත්‍රය පිළියෙල කෙරේ. |
| කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන්<br>III. තීරණ ගැනීම<br>IV. තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>V. අභිප්‍රේරණය හා අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>VI. නායකත්වය<br>VII. පාලනය<br>VIII. සංවිධාන ව්‍යුහය හා සංවිධාන වර්ග<br>IX. කළමනාකරණ පරිසරය (පරිසරය) |

සටහන 1 : මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පමණක් පැවැත්වෙන අතර අපේක්ෂකයෙකුට කැමති භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. මෙම විභාගයේ ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි. ස්වකීය අයදුම්පතේ විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

සටහන 2 : විභාගයේ ලකුණු යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙර අයදුම්කරුවන්ට නිකුත් නොකරන අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයටද ඉදිරිපත් නොකරයි.

සකස් කළේ : අත්සන : ...............

ඒ. ජේ. පී. අයිශානි
පරිපාලන නිලධාරි (...)
දුම්රිය ...

නම : ...............
තනතුර : ...............
දිනය : 2022.11.15...............

පරීක්ෂා කළේ : අත්සන : ...............
(විෂය භාර ජ්‍යෝෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ...............
තනතුර: ...............
දිනය : 2022.11.21...............

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...............
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්. ඒ. ඩී. එස්. ගුණසිංහ
තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරි
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.
දිනය : ...............
නිලමුද්‍රාව : ...............